**ශීර්ෂය 25 - සීමා නිර්ණය කොමිෂන් සභාව**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**1.1 මතය**

**-------**

සීමා නිර්ණය කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුලි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට සීමා නිර්ණය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි .

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2019 දෙසැම්බර් 3 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත් එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අවසාන භාණ්ඩාගාර පරිගණක ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කර නොතිබුණි. | චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව අවසාන භාණ්ඩාගාර පරිගණක ගිණුම් ප්‍රකාශන ඇමුණුම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කළ යුතුවේ. | මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම් වියදම් හා අනෙකුත් ප්‍රධාන ලෙජර් ශේෂයන්හි අගය ආකෘති කිහිපයක ආසන්න රුපියලට වාර්තා කර නොතිබුණි. | චක්‍රලේඛයේ 3.2 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආදායම් වියදම් හා අනෙකුත් ප්‍රධාන ලෙජර් ශේෂයන්හි අගය ආසන්න රුපියලට වාර්තා කළ යුතුවේ. | ඉදිරි වාර්තා සැකසීමේදි මෙවැනි අඩුපාඩු ඇති නොවීමට කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ( ඒසීඒ -සී ආකෘතිය) 2019 වර්ෂයේ තොරතුරු නිවැරදිව සටහන් කර ඇතත් 2018 වර්ෂයේ තොරතුරු භාෂාත්‍රයෙන්ම ඇතුළත් කර නොතිබුණි. | 2018 වර්ෂයේ තොරතුරුද භාෂාත්‍රයෙන්ම ඇතුළත් කළ යුතුවේ. | පරිවර්තනයේදී මෙවැනි දෝෂ සිදු නොවන ලෙස කටයුතු කරන මෙන් අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කොමිෂන් සභාව විසින් ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර,ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) නිලධාරීන් රාජකාරි සඳහා කාර්යාලයෙන් බැහැර යන අවස්ථා වලදී හා නැවත පැමිණීමේදී ඒ පිළිබඳව සටහන් තැබීමට බැහැර යාමේ ලේඛනයක්පවත්වා නොතිබුණි. | බැහැර යාමේ ලේඛනයක් නඩත්තු කළ යුතුවේ. | මින් ඉදිරියට නඩත්තු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. |
| (ii) භාණ්ඩ නිකුත් කිරීම පිළිබඳ විස්තර, බඩු වට්ටෝරු පොතෙහි ඇතුළත් කර නොතිබුණි. | භාණ්ඩ ලබා ගැනීම, නිකුත් කිරීම පිළිබඳ විස්තර බඩු වට්ටෝරු පොතෙහි ඇතුළත් කළ යුතුවේ. | මින් ඉදිරියට බඩු වට්ටෝරු පොතේ ඇතුළත් කිරීමට උපදෙස් ලබා දෙන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| පුනරාවර්තන වැය විෂයයන් 02 ක් හා මූලධන වැය විෂයයන් 02ක් සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | 2019 අප්‍රේල් 08 දිනැති අයවැය චක්‍රලේඛ 03/2019 හි 6 ඡේදය අනුව විදේශ ගමන් සීමා කිරීමට හා අවම කිරීමට උපදෙස් ලැබී ඇත.දේපල ණය ලබා ගත් නිලධාරීන් සභාවේ දැනට නොසිටින අතර ණය ලබා ගත් නිලධාරියෙකු ස්ථානමාරු වී පැමිණියහොත් හෝ සිටින නිලධාරියෙකු දේපල ණය ලබා ගත හොත් යන කාරණා සලකා බලා මුදලක් මෙම ඇස්තමේන්තු හරහා වෙන් කර ඇත.ඉදිරි ඇස්තමේන්තු වෙන් කිරීමේ දී මෙම ඉතිරිය සලකා බලා ඇස්තමේන්තු සැකසීමට උපදෙස් දෙන ලදී. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| **(i) මුදල් රෙගුලාසි 138(8)** | අතිකාල දීමනා වවුචර්වල සම්පූර්ණ කළ යුතු වැඩ සහ ඒකක පිළිබඳ විස්තර හා කළ වැඩ විස්තර සඳහන්ව නොතිබුණද, අතිකාල දීමනා වවුචර් සහතික කර ගෙවීම් කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. |
| **(ii) මුදල් රෙගුලාසි 264** | අලුත්වැඩියා වෙනුවෙන් දරන ලද වියදමට අදාළ කුවිතාන්සිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මුදල් ලබා ගත් බවට ගෙවීම් වවුචරයේ අත්සන හෝ යොදා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු ඇති නොවන ලෙස කටයුතු කිරීමට අදාල නිලධාරීන්ට උපදෙස් දෙන ලදී. |
| **(ආ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | නිලධාරීන්ගේ කාර්යාලයට පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කර ගෙන අදාල ඇඟිලි සළකුණු යන්ත්‍රය සපයා ගැනීම සඳහා මිල ගණන් කැඳවීම 2019 සැප්තැම්බර් 23 දින සිදු කලද,ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් නොවුණි. රජය විසින් |

| | | | |
|---|---|---|---|
| | | | අත්‍යවශ්‍ය ප්‍රසම්පාදන පමණක් සිදු කරන ලෙසට 2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 දරන චක්‍රලේඛයෙන් දැනුවත් කරන ලද හෙයින් අදාල ප්‍රසම්පාදන කටයුතු ඉදිරියට සිදු නොකරන ලදී. |
| **(ඇ) 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6 ඡේදය** | අභ්‍යන්තර පාලන ක්‍රමයක් ලෙස පවත්වා ගත හැකි පැමිණීමේ පිටවීමේ ලේඛනයද නිසිපරිදි නඩත්තු කර නොතිබුණි. | පැමිණීමේ පිටවීමේ ලේඛනයද නිසි ලෙස නඩත්තු කළ යුතුවේ. | මින් ඉදිරියට එම අඩුපාඩුව සම්පූර්ණ කිරීමට උපදෙස් ලබා දී ඇත. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදනයන්**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ දැක්වීම** |
|---|---|---|
| 2019 ප්‍රසම්පාදන සැලැස්මෙහි වර්ෂය තුල කාර්යයන් 5ක් ඉටුකිරීමට සැලැසුම් කර ඇතත් ඉන් කාර්යයන් 2ක් පමණක් ඉටුකර තිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.570,000 ක් වූ අතර ඉහත කාර්යයන් 2 සඳහා වියදම රු.264,110 ක් වූයෙන් මූල්‍ය ප්‍රගතිය සියයට 46 ක් විය. | 2019 ප්‍රසම්පාදන සැලැස්මෙහි කාර්යයන් ඉටුකිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 සැප්තැම්බර් 24 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 5/2019 චක්‍රලේඛයෙහි 3 ඡේදය අනුව අත්‍යවශ්‍ය කාර්යාලයීය උපකරණ පමණක් සපයා ගැනීමට කටයුතු කිරීම නිසා කාර්යයන් 2 ක් පමණක් ඉටු කරන ලදී. |

**3.2 වෙනත් නිරීක්ෂණ**

---------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා රු.15,875,000 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර වර්ෂයේ මුළු වියදම රු.12,849,555 ක් විය. ව්‍යවස්ථාදායකය විසින් දැනට නිශ්චිත කාර්යභාරයක් වෙන්කර දී නොමැති බව සඳහන් කර තිබූ බැවින් රු.12,849,555 ක වියදමේ කාර්යසාධනය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය. | ආයතනය සඳහා නිශ්චිත කාර්යයභාරයක් තිබිය යුතුවේ. | ව්‍යවස්ථාදායකය විසින් නිශ්චිත කාර්යභාරයක් මේ වන තෙක් වෙන් කර දී නොමැති වුවද ඉදිරියේදී අදාළ සීමා නිර්ණය කටයුතු වල කාර්යයන්හි කොමිෂන් සභාව නිරතව සිටින අතර ව්‍යවස්ථාදායකය වෙත අවස්ථා කිහිපයකදී නිශ්චිත කාර්යභාරයක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් සඳහා මේ වන තෙක් ප්‍රතිචාර ලැබී නොමැත. |
| (ආ) | කොමිෂමේ වාහනයක් 2019 ජනවාරි මාසයේ කි.මී.60 සිට කි.මී 410 දක්වා දින 8 ක් තුළ ධාවනය කර ඇතත් දෛනික ධාවන සටහන් වල කුමන රාජකාරි සඳහා ගමන් කලේද යන්න සටහන්ව නොතිබුණි. | දෛනික ධාවන සටහන් නිසිපරිදි යාවත්කාලීන කළ යුතුවේ. | පළාත් සභා මැතිවරණ කොට්ඨාශ සීමා නිර්ණය පිළිබඳ දැනුවත් කිරීමේ රාජකාරි සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත තොරතුරු ඇතුළත් ලිපිගොනු රැගෙන යාමට රථය ධාවනය කර ඇත. |

**4. මානව සම්පත් කළමණාකරණය**

-------------------------------------

2019 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු දෙක සඳහා වැඩබලන නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි.ද්විතීයික මට්ටමේ අනුමත තනතුරු හතෙන් පහක් පුරප්පාඩුව පැවතුණි.